ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 2 - 2006/2007

**ගිවිසුම් නීතිය - LWU 2311**

කාලය - විනාඩි හතළිහයි.

---

දිනය - 2006.11.08 වේලාව - ප.ව.01.30 - ප.ව.02.10 දක්වා

---

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*
*<u>එක් ප්‍රශ්නයකට</u> පමණක් පිළිතුරු සපයන්න.*

01. පහත සඳහන් සිද්ධීන්හි නෛතික ප්‍රතිඵල නිශ්චය කරන්න. ඔබේ පිළිතුර සඳහා විනිශ්චිත නඩුතීරණ ඇත්නම් ඒවා ද උපකාරී කරගත යුතුය.

(අ) 'අනඟ කුලීරථ සේවය' හි හිමිකරුවන A එක් කුලීරථයක් ගණිකාවක් වන B ට කුලියට දුන්නේ එම රථය ජංගම ගණිකාහලක් වශයෙන් භාවිතා කරනු ඇති බව දනිමිනි. කෙසේවුවද ගිවිසගන්නා ලද කුලිය ගෙවීම B විසින් පසුව ප්‍රතික්ෂේප කරයි.

(ආ) 'C' ට අයත් ගබඩාවක ඇති රතුළූණු තොගයක් 'D' ට විකිනීමට 'C' විසින් ගිවිස ගන්නා ලදී. නමුත් ගිවිසගන්නා අවස්ථාවේදී එම රතුළූණු තොගය ගින්නකින් විනාශ වී තිබිණ.

(ඇ) 'E' සිමෙන්ති මිශ්‍ර කිරීමේ යන්ත්‍රයක් 'X' ට කුලියට දීමට එකඟ විය. එම ගිවිසුමේ සඳහන් වූයේ "ගිවිසුමට අනුව ගෙවිය යුතු වාරික මුදල් අප්‍රමාදව ගෙවීම අත්‍යවශ්‍ය වේ." යන්නයි. කෙසේ වුවද කුලියට ගන්නා විසින් එක් වාරිකයක් ගෙවීමට ප්‍රමාද විය.

02. ගිවිසුම්වල නියමයන් කෙරෙහි 1997 අංක 26 දරණ අසාධාරණ ගිවිසුම් නියම පනත සීමා පනවයි.

විමසන්න.

\- හිමිකම් ඇවිරිණි. -